

# ඇල්. එච්. මෙත්තානන්ද
## (1894 – 1967)

මහාචාර්ය ඇල්. ජී. හේවගේ

සියවස් හතරහමාරක පමණ කාලයක් විදේශික විජාතික මිථ්‍යා-දෘෂ්ටීන් ගේ මාර බලයට යට වී සිට 1948 දී දේශපාලන නිදහස ලබා ගත් ලංකාවේ සමහර නායකයෝ මුල දී ඒ ලැබූ නිදහසේ ප්‍රතිඵල රට පුරා විසිරී සිටි සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හාම ජාතියක ම හැම දෙනාට ම සාධාරණ ලෙස බෙදාදීම සඳහා අවංක වෑයමක් කළෝ ය. එ සේ කරනවා ඇතැයි බොහෝ දෙනා අවංකව බලාපොරොත්තු වූහ. විනාශ වී ගිය වැව් පිළිසකර කර, නව ගොවි ජනපද පිහිටුවීම හා උඩරට ගැමි කොමිසම පිහිටුවීම, නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, ආදිය මුල දී මෙ සේ කළ බවට සාක්ෂි ය. එ නමුත් ඒ සත් ව්‍යාපාර නැවතත් වරක් අපේ ම නායකයන් බොහෝදෙනාට ආවේශ වූ මාර බලවේගයන් කීපයකට ගොදුරුවීම නිසා දෝ අඩපණ විය.

පරම්පරා කීපයක් ම උන්හිටි තැන් නැතිවී ගොස්, අල බතල ටිකක් වත් වවාගෙන කෑමට තිබුණු ඉඩම් කැබැල්ලක් අහිමි වී, කර කියා ගන්නට රැකියාවකුත් නැති ව, කාගෙ කාගෙත් දුකසැප අසල්වැසියන් සමඟ හවුලේ බෙදා ගෙන, අසරණ ව අහිංසක ව එහෙත් තෙරුවන් සරණ යමින්, මළවුන්ට දෙවියන්ට පින් දෙමින් ගමේ පන්සලේ ඇසුර ලබමින් උඩරට පහතරට පිටිසර ගම්වල විසිරී සිටි ලක්ෂ සංඛ්‍යාත අපේ ජනතාව සියලු බලාපොරොත්තු සුන් වී, ඉතින් දැන් කාට කියමුදැයි සුසුම්ලමින් සිටියේ මේ යුගයේ දී ය.

නගරබද කම්කරුවන් සංවිධානය කොට ඔවුන් වෙනුවෙන් සටන් මෙහෙයවන නායකයන්ගෙන් අඩුවක් නො වී ය. වතුකරයේ තේ නෙළන්නන් වෙනුවෙන් එ වැනි ම නායකයන් අනුක්‍රමයෙන් සංවි-ධානය වී ඉදිරියට එන හඬ වතුකරයේ ගැමි ජනතාවට ඇසිණි. පරම්-පරාගත ව ම දිවි දෙ වැනි කොට රැකගෙන ආ ආගමත්, භාෂාවත්, ගැමි ගුණවගාවත් අතහැර ගිය සමහරකුට තමන් වැළඳගත් අලුත් ආගමේත්, අලුත් භාෂාවේත්, අලුත් ජීවන රටාවේත්, අනුභාවයෙන් මෙන් ඔවුන් ගැන සොයා බලා ඔවුන්ට සහන ලබාදෙන දේශීය

විදේශීය සංවිධාන සමහරක් ද විය. නමුත් ඒ කිසිවකු ගේ අවධානය යොමු නොවූ ඉහත සඳහන් කළ දහස් ගණන් දුප්පත් ගැමි ජනතාව වෙනුවෙන් වෙහෙසෙන කිසිවෙක් නොවී ය. මේ ලිපියෙන් හැඳින්-වීමට බලාපොරොත්තු වන ලොකුසතු හේවගේ මෙත්තානන්ද මහතා ඉහතින් දැක් වූ මාර බලවේගවල යථා තත්වය අවබෝධ කර ගෙන කාට කාටත් මහ හඬින් එය අවබෝධ කර දීමට වෑයම් කරමින් ජාතිය වෙනුවෙන්, ආගම හා භාෂාව වෙනුවෙන් දුක් විඳින ජනතාව වෙනු-වෙන්, ආත්ම විශ්වාසයෙන් හා ආත්ම ශක්තියෙන් අවංකව, බොහෝ විට හුදකලා ව ම,. මාර සටනක් කළ, කිසි කලෙක අමතක නොකළ යුතු ජාතික වීරයෙකි. නිදා සිටි සිංහල බෞද්ධයා අවදි කළ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා මෙන් ම භාරතයට නිදහස ලබා දුන් මහත්මා ගාන්ධිතුමා ද අනුගමනය කොට දේවත්වයට ගිය බෝධිසත්වයකු ලෙස සැලකිය හැකි උතුමෙකි.

ඒ දා එ තුමා ඇති සැටියෙන් ම තේරුම්ගත් පරිදි අපේ ම නායකයන්ට ආවේශ වූ මාර බලවේගයන් කාට කාටත් හඳුන්වා දීමට මහ හඬින් නාද කළ මෙත්තානන්ද මහතා ගේ කේසර සිංහ නාදය නිසා තාව-කාලික ව යටපත් වූ නමුත් නැවත නැවතත් ඒවා ඉස්මතු වී එදාටත් වඩා බලවත් ව ක්‍රියාත්මක වෙමින් පවතින බව පෙනේ. ඒ නිසා මෙත්තානන්ද මහතා කළ අභීත කේසර සිංහනාදය නැවත නැවතත් පරපුරෙන් පරපුරට එ තුමා ගේ චරිතය ගැන කියවා, කියවන්නට සලස්වා, මතක් කළ යුතුව ඇත. මෙත්තානන්ද මහතා එ දා ඒ මාර බලවේග ඇති සැටියෙන් දුටු හැටිත්. ඒවාට එරෙහි ව සටන් කළ හැටිත්. ඒ සඳහා උපයෝගී කරගත් ආයුධත්, මාරාවේශ වූ සමහර අපේ ම බලකාමී, නිලකාමී, ධනකාමී, නායකයන් ටික දෙනකු එතුමා පිළිකුල් කොට නින්දා අපහාස කළ හැටිත්, එ තුමා ගේ හඬට කන් නොදුන් නිසා ජාතික දේහයට ආවේශ වූ ඒ මාරබලවේගයන් එ දා මෙන් ම අදත් කොතැනක් ක්‍රියාත්මක වන හැටිත්, (මෙත්තානන්ද මහතා ගේ චරිතාපදානය අනුව) අපි දැන් සැකෙවින් විමසා බලමු. ඒ මහතා ගෙනගිය ව්‍යාපාරවල ප්‍රතිඵලයක් වශයෙන් අද ත්‍රිවිධ හමු-දාවේ. රජයේ අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල, පෞද්ගලික අංශයේ ව්‍යාපාරවල ආදී හැම තැනක ම ඉහළ පෙළේ තනතුරු ලබා ගෙන සිටින හැම දෙනා ම. මෙත්තානන්ද මහතාට සදා ණය ගැති ය. ඒ තීරණය කෙතරම්දුරට සාධාරණදැයි පෙනෙන්නේ, ඒ මහතා ගේ ව්‍යාපාරවලට පෙර මේ රටේ තත්වය ගැන සොයා බලනවිට ය. මෙත්තානන්ද මහතා ගේ ජීවන චරිතය කියවීමෙන් ඒ කාලය පිළිබඳ තරමක අවබෝධයක් ලබාගැනීමට පුළුවන. එ තුමාට පින් සිදුවන්නට

අද ඉහළ තැන්වල වැජඹෙන කවුරුනුත් ඒ මහතා ගේ සේවා පරමාර්ථ තේරුම් අරගෙන පොදු ජනතාව ගේ හිතසුව පිණිස නාස්තියෙන් හා දූෂණයෙන් තොර ව සේවය කරමින්, විවේකය ලබාගත හැකි තරමට හා ආදායමේ ප්‍රමාණයටවත් දුක් විඳින ජනතාව ගැන සොයා බලා යමක් කරන්නට පුළුවන්නම් ඒ වනාහි මෙත්තානන්ද මහතා නමට කළහැකි හොඳ ම ගෞරවය යි.

**මෙත්තානන්ද කුමරුවා උපන්නේ 1894 මාර්තු මස 19 වැනි දා අම්බලන්ගොඩ කලුමඩුමුල්ලේ දී ය.** පියා එ වකට කඩුගන්නාවේ විශාල වෙළෙඳ ව්‍යාපාරයක අයිතිකරු වූ ලොකුසතු හේවගේ තෝමස් ද සිල්වා මුදලාලි මහතා ය. මව වීරසූරිය කරලිනාහාමි මහත්මිය යි. පිරිමි පස් දෙනකු සහ දුවකගෙන් යුත් පවුලක් වැඩිමලා විය. අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ මූලික අධ්‍යාපනය ලබා ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයේ ද්වීතියක අධ්‍යාපනය ලැබුවේ ය. ඉනික්බිති රජයේ ගුරු විද්‍යාලයට ඇතුළත් වී පුහුණු ගුරුවරයෙක් විය. 1915 දී ඇති වූ සිංහල, මුස්ලිම් අරගල යුගයේ දී යුද හමුදාවේ ස්වේච්ඡා සේවක බලකායේ සේවය කරන්නට සිදුවිය. 1923 දී අම්බලන්ගොඩ පෝරඹ වික්‍රමසූරිය වලව්වේ එවකට සිටි වැදගත් ම පවුලක වන ජේ. ද. එස්. වික්‍රමසූරිය මුදලිතුමා හා එම මැතිනිය ගේ දියණියක වූ සීලියා වික්‍රමසූරිය යුවතිය ආවාහ කර ගත්තේ ය. එයින් ටික කලකට පසු ලන්ඩන් විශ්ව විද්‍යාලයේ උපාධියක් ද ලබාගත් එ තුමා 1930 දී පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා තම මැතිනියත් සමඟ ම එංගලන්තය බලා ගියේ ය. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතිකයක් ද ලබා ගෙන අධ්‍යාපනපති උපාධිය (MA) සඳහා පාඨමාලාවක් ද හැදෑරුවේ ය. එංගලන්තයේ සිටි කාලයේ දී නිවාඩුවක් ලැබුණු හැම අවස්ථාවකින් ම උපරිම ප්‍රයෝජන ගෙන එංගලන්තයේත්, අයර්ලන්තයේත්, යුරෝපා මහාද්වීපයේ ප්‍රංශය, ජර්මනිය, ස්විට්සර්ලන්තය වැනි රටවලත් විනෝදය හා අධ්‍යාපනය සඳහා සංචාරය කළ බව වාර්තා වේ.

අවුරුදු තිහකටත් වැඩි ආදර්ශමත් ගුරු සේවයෙන් විශ්‍රාම ලබා ඉනික්බිති ඉතිරි අවුරුදු දොළහක පමණ කාලය සම්පූර්ණයෙන් ම ජාතික ආගමික ව්‍යාපාර මෙහෙයවමින් සිට 1967 නොවැම්බර් මස පළමුවන දා දිවංගත වූ මෙත්තානන්ද මහතාට උගත් පුත්තු තිදෙනෙක් ද දියණියෝ දෙදෙනෙක් ද සිටිති. ලංකාවේ විශ්ව විද්‍යාල සියල්ල එක ම විශ්ව විද්‍යාලයක මණ්ඩප වශයෙන් පවතිද්දී එහි උපකුලපති වශයෙන් සිටි, දැනට අප අතර නැති ඇල්. එම්. සුමනදාස මහතා, මෙත්තානන්ද මහතා ගේ සහෝදරයෙකි. මොරටු විශ්ව විද්‍යාලයේ උපකුලපති

ව සිටි මහාචාර්ය සී. පටුවතවිතාන මහතා මෙත්තානන්ද මහතා ගේ එක ම සහෝදරියගේ පුතා ය. මෙත්තානන්ද මැතිනියත් පවුලේ අනෙක් හැම දෙනාමත් එකතු ව මෙත්තානන්ද අධ්‍යාපන අරමුදල නමින් භාරකාර අරමුදලක් පිහිටුවා ගෙන රජය පිළිගත් පුණ්‍යායතනයක් ලෙස දුප්පත් බුද්ධිමත් ළමයින් තෝරා ශිෂ්‍යත්ව ප්‍රදානය කරන බව දැනගන්නට ලැබිණ.

ගුරු සේවා කාලය:

පුහුණු උපාධිධාරියකු වූ මෙත්තානන්ද මහතා කොළඹ ආනන්ද මහා විද්‍යාලයේ උප ගුරුවරයකු වශයෙන් සේවය ආරම්භ කළේ 1920 දී ය. ඊට පෙර කෙටි කාලයක් කළුතර හෝලි ක්‍රොස් විද්‍යාලයේ ද සේවය කළේ ය. නිර්මාංශ ආහාර පමණක් ගත් මත්පැනින් හා දුම්බීමෙන් තොර ව සිටි ඒ මහතා බෞද්ධ විදුහලක සිටිය යුතු ආදර්ශමත් දක්ෂ ගුරුවරයකු බව එතුමා පත්කර ගත් පී. ද එස්. කුලරත්න මහතා විසින් ම සඳහන් කළේ 1967.11.03 දින ඔබ්සර්වර් පත්‍රයට ලියන ලද ලිපියකිනි. ආනන්දයෙන් කොටසක් ලෙසට ආරම්භ කළ නාලන්ද විද්‍යාලයේ විදුහල්පති වශයෙන් යවන ලද මෙත්තානන්ද මහතා 1925 දක්වා එහි සේවය කොට එංගලන්තයේ සිට ආපසු පැමිණි මලලසේකර මහතාට ඒ තනතුර භාර දී නැවතත් ආනන්දයට ම ගියේ ය. 1932 දී කුලරත්න මහතා මහනුවර ධර්මරාජයේ සේවයට යද්දී ආනන්දයේ වැඩබලන විදුහල්පති තනතුර මෙත්තානන්ද මහතාට භාර දෙන ලදී. කුලරත්න මහතා නැවතත් එහි ස්වර්ණ ජයන්ති යුගයේදී ආනන්දයේ විදුහල්පති තනතුර භාරගත් නිසා ඊටපසු අපට මෙත්තානන්ද මහතා හමු වන්නේ 1936 සිට මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති වශයෙනි. අවුරුදු දහයකට ආසන්න කාලයක් ධර්මරාජය ගොඩනැගීමට අමතක නොකළ යුතු සේවයක් කොට මෙත්තානන්ද මහතා 1945 දී ආපසු ආනන්දයට පැමිණියේ ය. මේ වර එහි විදුහල්පතිවරයා වශයෙනි. එතුමා මේ තනතුර භාර ගැනීමට පැමිණියේ ආනන්දයේ ඉතාමත් ම අභාග්‍ය සම්පන්න යුගයෙන් නව යුගයකට ගෙනයාම සඳහා යයි කීමට තරම් තොරතුරු එහි ඉතිහාසය බලනවිට පෙනේ. එතුමා වැඩ භාර ගන්නා ආනන්දය ඇතුළතත් පිටතත් වචනාර්ථයෙන් මෙන් ම ව්‍යංගාර්ථයෙන් ද ගිනිගෙන තිබුණු අවස්ථාවක ය. ඒ මහතා වැඩ භාරගැනීමට පැමිණි දිනයේ දී ම තමා පැමිණි මෝටර් රියට පවා ගල් ගසා කුවාල කළ බව වාර්තා වේ. නමුත් මෙත්තානන්ද මහතා අධෛර්‍ය වූයේ නැත්තේ ධර්මරාජය මෙන්ම ආනන්දයත් එකලට සුදුසු ආදර්ශමත් බෞද්ධ විද්‍යාලයන් දෙකක් වශයෙන්, ගොඩනැගීමට එතුමා තුළ තිබුණු දෛව නියමය විය හැකි ය. ඒ නිසා පසු ව ආ සිට ම අනුක්‍රමයෙන්

ආනන්දයේ නව යුගයක් ආරම්භ කොට 1954 දී එතුමා විශ්‍රාම ගන්නා විට එය කාටත් ආඩම්බර විය හැකි තත්වයේ ශ්‍රේෂ්ඨතම ජාතික විද්‍යාලයක් බවට පරිවර්තනය කළේ ය. ආනන්දයේ වැඩ භාර ගන්නා විට ගුරු දෙගුරු සිසු දෙපිරිස ම භේද භින්න වී සිටි විකාර විලාසය ගැන සිතන විට මේ සේවයේ අගය විශේෂයෙන් මතුවේ. දැනට ඇති ගොඩනැගිලිවලින් වැඩි කොටසක් එ තුමා ගේ යුගයේ දී එ තුමා ගේ නායකත්වයෙන් ආරම්භ කළ සංවර්ධන ව්‍යාපාරවල ප්‍රතිඵල බව කවුරුත් දනිති. එ තුමා ගොඩනැගිලි ආදී විදුහලේ බාහිර අවශ්‍යතා දියුණු කළේ ය. එ මෙන් ම අභ්‍යන්තරයේ අධ්‍යාපනික තත්වය ද දියුණු කොට ආනන්ද මහා විද්‍යාලය මේ රටේ ජාතික පුනර්ජීවයේ උල්පත බවට පරිවර්තනය කළේ ය. ඒ නිසා එ තුමා වැඩ භාර ගනිද්දී ගිනිගෙන තිබූ ආනන්දය එ තුමා විශ්‍රාම ගන්නා විට බෞද්ධ අබෞද්ධ හැම දෙනා ගේ ම ප්‍රසාදයට ලක් වූ ජාතික විද්‍යායතනයක් විය. 1920 සිට 1954 දක්වා ගුරු සේවයේ නිරත වූ අවුරුදු තිස් හතරක කාලය තුළ මෙත්තානන්ද මහතා කළේ මේ රටට අවශ්‍ය අවංක සංවර නායකයන් රැසක් බෝ කිරීමේ ජාතික අධ්‍යාපනික ව්‍යාපාරයක යෙදීම මිස දේශපාලනය සමඟ පාසලේ සේවය පටලවා ගැනීම නොවේ. කලිසම් කෝට් අතහැර ජාතික ඇඳුම වශයෙන් රෙද්දත් බැනියමත් ඇඳගෙන විදුහල්පති තනතුරේ වැඩ කිරීමෙන් එදා මේ රටට වාම් උදාර බෞද්ධ අධ්‍යාපන සේවාවක් කළ. අමතක නොකළ යුතු කිප දෙනා අතරෙන් මෙත්තානන්ද මහතා ද එක් කෙනෙකි. ආනන්දයට සම්බන්ධ වූ පි. ද ඇස් කුලරත්න, ගුණපාල මලලසේකර, ඇම්. ඩබ්ලියු. කරුණානන්ද යන නම් ඒ සමඟ ම සඳහන් කළ යුතු වේ.

### බෞද්ධ තොරතුරු පරීක්ෂක සභා වාර්තාව

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් පත් කරන ලද බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාව මඟින් බෞද්ධයා ගේ නැති වී ගිය අයිතිවාසිකම් පිළිබඳවත්, ඒවා නැවත ලබාදීමට ගතයුතු ක්‍රියාමාර්ගත් පැහැදිලි ව පෙන්වා දෙන ලදී. එහි ඇති කිසි ම විවේචනයක් හෝ යෝජනාවක්, මේ රටේ ආගම් හා භාෂා ආදී වශයෙන් සලකා කාටවත් වරදක්, අපරාධයක් හෝ අසාධාරණයක් කිරීමට බලාපොරොත්තු වී නැත. එ නමුත් යටත් විජිත යුගයේ අසාධාරණයෙන්, අධර්මයෙන් හා අයුතු බලපෑම් මඟින් ලබාගත් විශේෂ වරප්‍රසාද ඇති සුළු පිරිසක් තවමත් ක්‍රියාත්මක වන බව පෙන්වා දී ඇත. මූලික මිනිස් අයිතිවාසිකම් නැතිවන ලෙසට පරදේශී පාලකයන් විසින් පාගාගෙන සිටි පොදු ජනතාව ගේ හිතසුව පිණිස මේ වරප්‍රසාද සමහරක් සාමයෙන් බෙදා හදා ගැනීමට හා රට සංවර්ධනය කිරීමට අවශ්‍ය යෝජනා එහි විය. ඒ

යෝජනා ක්‍රියාත්මක කරන විට ජාති ආගම් කුලභේද ආදියෙන් තොර ව කාටත් සාධාරණ, කාටත් දේශපාලන නිදහසේ ප්‍රයෝජන ලබා ගත හැකි, පාලන ක්‍රමයක් ඇති කර ගත හැකි බව ද එහි පෙන්වා තිබුණේ ය. නිදහස් ආණ්ඩුක්‍රම පනතක්, නිදහස් ජාතික අධ්‍යාපන පද්ධතියක්, බෞද්ධයන් ගේ පොදු ප්‍රශ්න සාමයෙන් විසඳා ගත හැකි බුද්ධශාසන මණ්ඩලයක්, බෞද්ධ භික්ෂූන් වහන්සේලා ගේ ප්‍රශ්න පොදුවේ සාකච්ඡා කොට විසඳා ගත හැකිවෙන පරිදි සංඝාධිකරණ පනතක්, දේශීය සංස්කෘතියට මුල්තැන දෙන රාජ්‍ය ප්‍රතිපත්තියක්, හා විදේශ ප්‍රතිපත්තියක් ආදිය එහි තිබුණු වැදගත් යෝජනා සමහරකි.

යථෝක්ත වාර්තාව මුලුරටේ ම කාටත් දැනගත හැකි පරිදි ප්‍රසිද්ධියේ ම මහා සංඝයා ඇතුළු මහජනයා වෙත ඉදිරිපත් කළ යුතු යයි තීරණය විය. ඒ සඳහා මහාවංශයේ සඳහන් පරිදි බුදුරජාණන් වහන්සේ ගේ පිරිනිවන් පෑමෙන් අවුරුදු 2500 ක් සම්පූර්ණ වන 1956 වර්ෂයේ නිදහස් දින උත්සවය පැවැත්වෙන පෙබරවාරි මස 4 වැනි දා ආනන්ද මහා විද්‍යාලය තෝරා ගැනීම නිසා මෙත්තානන්ද මහතා ගේ බලපෑම කෙතරම්දැයි දැනගත හැකි ය. ලංකාවේ යටත් විජිත යුගයෙන් පසු පවත්වන ලද ගිහි පැවිදි දෙ පක්ෂය ම සහභාගි වූ බෞද්ධ ප්‍රබෝධයක් ජනිත ප්‍රථම මහා සභාව ලෙස මෙය හැඳින්විය හැකි ය. මෙත්තානන්ද මහතා ගේ කැපී පෙනෙන ක්‍රියාකාරී ජාතික පොදුජන සේවාව ආරම්භ වූයේ මෙ තැනින් ය. ඒ වර්ෂයේ දී පවත්වන ලද මහා මැතිවරණයට පෙර මේ වාර්තාව පාලන බලය බලාපොරොත්තු වූ ප්‍රධාන දේශපාලන පක්ෂවලට ඉදිරිපත් කළවිට මහජන එක්සත් පෙරමුණේ නායක එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ඒවා පිළිගෙන ක්‍රියාත්මක කිරීමට ප්‍රතිඥා දුන්නේ ය. මෙ තෙක් කල් අපක්ෂපාතී ව මධ්‍යස්ථ ව පක්ෂ දේශපාලනයෙන් ඈත් ව සිටි මෙත්තානන්ද මහතා මෙ තැන දී මහජන එක්සත් පෙරමුණේ පාලන බලය ලබාදීම සඳහා කෙළින් ම ඉදිරිපත් විය. වෙනත් බොහෝ දෙනා මෙන් තම තමන් ගේ ආත්මාර්ථකාමී අරමුණු ඉටුකර ගැනීම සඳහා නොව මෙතෙක් ඔහු තුළ මෝරමින් පැවති පොදුජන හිතකාමී ජාතික ආගමික පරමාර්ථ ඉටුකර ගැනීමේ මාර්ගයක් වශයෙන් මේ පියවර ගත් බව මහා මැතිවරණයෙන් පසු ඇති වූ සිදුවීම්වලින් පැහැදිලි වේ.

මේ මැතිවරණ ව්‍යාපාරය සඳහා මෙත්තානන්ද මහතා විසින් සපයන ලද ලිපිවලිනුත්, පවත්වන ලද දේශනවලිනුත් පැහැදිලි වන්නේ එතුමා බලාපොරොත්තු වූ සමාජ අධ්‍යාපන සේවාව බෙහෙවින් සාර්ථක ලෙස කර ගන්නට පුළුවන් වූ බවයි. සියවස් හතරකට වැඩි කාලයක් පැවැති මිථ්‍යාදෘෂ්ටි අධ්‍යාපන ක්‍රමය නිසා වහල් පරාධීන

නිවට ජනතාවක් වශයෙන් මන්දෝත්සාහික ව උදාසීන ව සිටි ගිහි, පැවිදි, ගැහැනු, පිරිමි, ලොකු, කුඩා, පොහොසත්, දුප්පත්, ජනතාව ගමක් ගමක් පාසා අවදි කරවන අධ්‍යාපන ව්‍යාපාරයක් මේ නිසා මෙහෙයවන්නට මෙත්තානන්ද මහතා වග බලා ගත්තේ ය. විශේෂයෙන් සිංහල බෞද්ධයාටත් සාමාන්‍යයෙන් යටත් විජිත යුගයේ පරදේශීන් ගේ හා පරගැතියන් ගේ අණසකට යට වී නිශ්ශබ්ද ව සිටි වැඩි ජනතාවටත් තමන්ට සිදු වී ඇති කනගාටුදායක තත්වයේ යථා ස්වභාවය ඇස් ඇර, කන් යොමා නුවණ මෙහෙයා විමසා බැලිමට මෙත්තානන්ද මහතා මෙහෙය වූ මේ අධ්‍යාපන ව්‍යාපාරයෙන් මහ පැදුණේ ය. ඒ නිසා නිදාසිටි ජාතියක් අවදි විය.

ලතින් ඇමරිකන් රටවල යුරෝපයෙන් පැමිණි අධිරාජ්‍යවාදී කතෝලික භක්තිකයන් ගේ පාලනයට යටත්ව සිටි දුක්විඳින ජනතාව අවදි කරවීම සඳහා මෙ වැනි අධ්‍යාපන සේවයක් කළ සුප්‍රසිද්ධ ජනතා අධ්‍යාපනඥයකු ලෙස සලකනු ලබන පෝලෝප්‍රේරෝ වැනි අයට යුනෙස්කෝ සාම ත්‍යාගය පවා ලැබුණු නමුත් මෙත්තානන්ද මහතා ගේ සේවයට එවැනි වටිනාකමක් හා ප්‍රසිද්ධියක් ලබා දීමට අපේ වරප්‍රසාද ලත් නායකයෝ අසමත් වූහ.

බුද්ධ ජයන්ති යුගයේ දී මෙසේ නිදිගැට හැර අවදි වූ ජාතියක් නිදහස් නිවහල් ජන සම්මතවාදී ධර්ම සමාජයක් ඇති කරගනු සඳහා බණ්ඩාරනායක මහතා ගේ ප්‍රධානත්වයෙන් ඉදිරිපත් වූ මහජන එක්සත් පෙරමුණට පාලන බලය ලබා දුන්නේ මුළුරට ම පමණක් නොව මුළු ලොව ම මවිතයට පත්කරමිනි. එක්තරා ප්‍රමාණයකට මෙත්තානන්ද මහතා අපේක්ෂා කළ පරිදි පොදු ජනතාව ගේ අස්වැසිල්ලට හා සැනසීමට මේ ආණ්ඩු පෙරළිය හේතු වූ නමුත් ඒ මහතා ගේ දීර්ඝකාලීන ජාතික අරමුණු නම් මෙයින් සැහෙන පමණ ඉටුවන බවක් පෙනුණේ නැත. එහෙත් නොයෙක් කූට උපක්‍රම මගින් බෞද්ධ විරෝධීන් මෙ තෙක් කල් සඟවා ගෙන සිටි වැදගත් කරුණු රැසක් සංඛ්‍යාලේඛන ඇතුළත් සාක්ෂි ඉදිරිපත් කරමින් මහජනයාට රටේ ඇති යථා තත්වය සාමාන්‍යයෙනුත් සිංහල බෞද්ධයා ගේ තත්ත්වය විශේෂයෙනුත් සවිස්තර ව පෙන්වා දීමට මෙත්තානන්ද මහතාට මේ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ගත හැකි විය.

බුද්ධ ජයන්ති යුගයෙන් පසු කාලය.

1956 දී ආණ්ඩු පෙරළිය ඇති වී නව රජයක් පිහිටුවීමට පෙර මෙත්තානන්ද මහතා කළ සේවයට ප්‍රතිඋපකාරයක් වශයෙනුත් නව රජයේ ප්‍රගතියට එතුමාගෙන් උපරිම ප්‍රයෝජනය ලබාගනු සඳහාත් අධ්‍යාපන



15. ර.මු.නී.ස. 89739

ඇමති පදවිය භාර ගැනීමට කැමති දැ යි බණ්ඩාරනායක මහතා මෙත්තානන්ද මහතාගෙන් විමසන ලදි. මෙත්තානන්ද මහතා එය ප්‍රතික්ෂප කළ විට චීනයේ හෝ බුරුමයේ හෝ තානාපති තනතුර භාර ගැනීමට කැමති දැයි විමසන ලදි. එය ද ප්‍රතික්ෂේප කළ එතුමා නැවතත් තමා විසින් පැහැදිලි ව පිළිගෙන තිබුණු පොදු ජාතික අරමුණු ඉටුකර ගැනීම සඳහා මීළඟට ගතයුතු ක්‍රියාමාර්ගය ගැන සලකා බැලුවේ ය. එතුමා ගේ හිතවතකු ලෙස සැලකූ බණ්ඩාරනායක නව අගමැතිතුමා මෙත්තානන්ද මහතා එ දා හැඳින්වූයේ එක්තරා ආකාරයක පිස්සකු වශයෙනි. බෞද්ධ මනෝවිද්‍යාව අනුව නම් මෙත්තානන්ද මහතා පමණක් නොව බණ්ඩාරනායක මහතා, අනගාරික ධර්මපාලතුමා වැනි අයත් කෙලෙසුන් සුන් නොකළ පෘථග්ජනයන් නිසා විවිධ තරාතිරමේ පිස්සන් ලෙස සැලකිය හැකි ය. බෞද්ධ අබෞද්ධ සම-හරුන් ඔවුන්ට ආගම් පිස්සන් සේ ද නම් කළ බව ඇත්තකි. එ නමුත් වෙනත් රටවල ආගම් පිස්සන් මෙන් අහිංසක අසරණ සාමකාමී ශිෂ්ට ජාතීන් ආයුධ බලයෙන් යටත් කිරිමටත් තමන් අදහන ආගම හෝ මතය නොපිළිගන්නා අය සමඟ යුධ වැදීමටත් ඔවුන් කිසිකලෙක පෙළැඹුණේ නැත. ඔවුන් කළේ පවතින සමාජයේ ඇති බලවත් අසාධාරණ ඇත්ත ඇති සැටියෙන් නොවළහා මහජනයා ඉදිරියේ කියා පෑම යි. අසාධාරණ නැති කර ගැනීම අවශ්‍ය සමාජ ක්‍රමයක් හැටියට මෙසේ කරන ලදි.

මේ කාලය වන විට මෙත්තානන්ද මහතා ගේ කීර්ති රාවයත් බලයත් රටපුරා විහිදී ගිය හැටි සුප්‍රසිද්ධ ලේඛකයකු වූ සයිරස් ඩබ්. සුරේන්ද්‍ර මහතා විසින් 1967 නොවැම්බර් මස 3 වන සිකුරාදා ලංකාදීප පත්‍රයට මෙත්තානන්ද මහතා ගේ අභාවය නිමිත්තෙන් සපයන ලද ලිපියක සඳහන් කරන්නේ මෙ සේ ය.

''හිතටත් හෘදය සාක්ෂියටත් පමණක් නොව දේශීය හා ජාතික ජීවිතයේ පැහැදිලිව පෙනුණු වුවමනාවන්ටත් එකඟ වන සේ ඇත්ත කිමටත් ඒ කියන ඇත්තට අනුව හැමවිට ම ක්‍රියාකිරීමටත් පෙළැඹුණු මෙත්තානන්දයෝ සිය ව්‍යාපාරයේ එක් උච්ච අවස්ථාවක දී මෙ රට ඔටුනු පමණක් නොපළන් අධිරාජයකු බඳු වූහ. ඔහු ගේ ලියන වචන මෙන් ම කියන වචන ද නීතියක් විය යුත්තක් විය. ශතවර්ෂ පහක් තිස්සේ මහ පාළු කාන්තාරයක් මෙන් වියළී ගිය අනාථ අසරණ සිංහල ජීවිතය පලබර වන උයනක් වී එහි තැනින් තැන දහස් ගණන් සුවඳැති මල් පිපෙන්නට පටන් ගත්තේ සිංහල බෞද්ධ උරුමයන් සහ අයිතිවාසිකම් නැති වී ගිය තැන් සහ නැති වී ගිය සැටිත් මෙත්තානන්ද-යන් විසින් මහ හඬින් සවිස්තර ව පෙන්වා දෙන විටය.''

පාලන බලය ලබාගත් අයට රට පාලනය කරන්නට ඉඩ හැර මෙත්තා-
නන්ද මහතා මීටපසු කළේ රටේ පෞද්ගලික හා රජයේ ආයතනවල
සිංහල බෞද්ධයන්ට අයිති සාධාරණ අයිතිවාසිකම් අනුව අධ්‍යාපනය,
රැකීරක්ෂා සන්නිවේදන මාධ්‍යය, විදේශ සේවා, ජාතික ආරක්ෂක
සේවා, පරිපාලන සේවා, ආදියෙහි කිසිම ක්ෂේත්‍රයක ඉදිරියට යෑමට
ඉඩ නො දී බාධාකරන බලවේග ගැන සොයා බැලීම යි. අවශ්‍ය අදාළ
තොරතුරු රටේ හැම පළාතකින් ම, හැම ආයතනයකින් ම, හැම
කාර්‍යාලයකින් ම රහසේත් ප්‍රසිද්ධියේත් එ තුමා වෙත ගලා එන්නට
පටන් ගත්තේ ය. එ සේ ලැබුණු තොරතුරුවල හරිවැරදි පරීක්ෂා
කිරීමට ද උපකාර කළ විශාල පිරිසක් දිවයින පුරා විහිද සිටි අතර
රජයේත්, පෞද්ගලික අංශයේත් ආයතනවල නිලධාරීහු ද මහත්
උනන්දුවෙන් අවශ්‍ය සියලු තොරතුරු මෙත්තානන්ද මහතාට ලැබෙන්-
නට සැලැස්වූවෝ ය. මොවුන් අතර සිංහල බෞද්ධයන් පමණක්
නොව දෙමළ හින්දු භක්තිකයෝ ද වූහ. කතෝලිකයනට විරුද්ධ ව
තොරතුරු ලබා දුන් ක්‍රිස්තියානි සිංහලයෝ ද වූහ. ඒ කවුරුත් ඔවුන්
කියන කථාවල් අනුව මෙත්තානන්ද මහතාට පැහැදිලි ව පෙනුණේ
කතෝලික ආක්‍රමණය ක්‍රියාත්මක වන හැටි යි. වියට්නාමය පිළි-
බඳ ලැබුණු තොරතුරු අනුවත් පෙනුණේ ඒ කතෝලික ආක්‍රම-
ණයේ යථා තත්වය යි. එ කල පළවූ සමහර පොත්පත්වලින් ද මේ ගැන
කරුණු හෙළි විය. මෙත්තානන්ද මහතා කිසි ම ආගමකට හෝ ආගම්
අදහන්නකුට විරුද්ධ වූයේ නැත. කතෝලිකයනට විරුද්ධ වූයේත්
නැත. එ නමුත් කතෝලික ආක්‍රමණයට ප්‍රසිද්ධියේ ම විරුද්ධ විය.
එ සේ කිරීමට තරම් සෑහෙන පිළිගත හැකි සාක්ෂි එ තුමා සතු ව
තිබුණේ ය.

තම ජාතික අපේක්ෂා ඉටුකර ගැනීම සඳහා බෞද්ධ ජාතික බල-
වේගය නමින් සංවිධානයක් ඇති කරගත් මේ යුගයේ දී මෙත්තානන්ද
මහතා වටා රොක් වූ බෞද්ධ නායකයන් විශාල සංඛ්‍යාවක් හිටි
නමුත් ඒ ව්‍යාපාරයේ සාර්ථක ප්‍රතිඵල භුක්ති විඳිමින් වැඩිකල් නො-
ගොස් ඒ මහතා තනිකර ගිය බව රහසක් නො වේ. ධර්ම සමාජය
නමින් සංවිධානයක් ආරම්භ කොට බෞද්ධ පෙරමුණ නමින් පුවත්
පතක් ද පළකළ නමුත් ඒ එකකින්වත් බුද්ධ ජයන්ති යුගයේ දී කළ
ප්‍රාතිහාර්ය පෑමට ඒ මහතාට පුළුවන් වූයේ නැත. පළමු ව පිලිප්
ගුණවර්ධන මහතාටත් දෙ වනු ව සිරිමා බණ්ඩාරනායක මහත්මියටත්
පිළිවෙළින් 1960 මාර්තු හා ජූලි මහා මැතිවරණවල දී උපකාර වී
පරාජය අත් වූ නිසා එ වැනි පසුබෑමකට මුල පිරුණේ යයි කීම නිවැරැදි
ය. එයින් වූයේ මෙත්තානන්ද මහතා ගේ අණට කීකරුවන රජයේ

බලවතුන් අඩුවීම ය. එහෙත් මෙත්තානන්ද මහතා පෙන්වා දුන් කරුණු නම් සම්පූර්ණයෙන් නොසලකා හැර ඉවත දැමීමට තරම් ඊටපසුව බලයට පත් නායකයන් වුවත් පෙළඹුණේ නැත.

මෙත්තානන්ද මහතා ගේ සේවයෙහි විශේෂයෙන් මතු වී පෙනෙන ලක්ෂණය වූයේ වරප්‍රසාද සහිත හෝ රහිත හැමදෙනා අතරට ම රටේ පවතින තත්ත්වය පිළිබඳ හැබෑ තොරතුරු ගෙන යාමට කළ වෑයම යි. එය එතුමා සැලකුවේ නියම ජාතික අධ්‍යාපන සේවයක් ලෙසට ය. මේ නිසා ම පුවත්පත් කොමිසමක් රජය ලවා පත් කරවාගෙන පුවත්පත් හා ගුවන් විදුලිය වැනි ජන සන්නිවේදනවල පැවතුණු අසාධාරණ අයථා ක්‍රම හා දූෂණ හෙළි කිරීමට උත්සාහයක් දැරුවේ ය. ඒවා මඟින් රටේ පොදු ජනතාව මුලා කිරීමට ගෙන ගිය ව්‍යාපාර සැඟෙන පමණ කා අතරත් ප්‍රචාරය කිරීමට මෙත්තානන්ද මහතා ගේ මේ ව්‍යාපාර සමත් විය. පසු ව පුවත්පත් රජයට පවරා ගැනීමට සූදානම් වෙද්දීත් ඒ මහතා පුවත්පත් නිදහස වෙනුවෙන් සටන් කළ පෙරමුණේ සිටි නායකයෙකි. නමුත් යටත් ව සිට නිදහස ලබා ගත් කුඩා රටක් වශයෙන් ජන සම්මතවාදයන් රැකගෙන වැඩිජනතාව ගේ නිදහස ලබාදීමට පුළුවන් වන්නේ වරප්‍රසාද ලත් ටික දෙනා ගේ නිදහස අවශ්‍ය ප්‍රමාණයට සීමා කිරීමෙන් බව ඒ මහතා නිතර නිතර සඳහන් කළ මතයකි. අලුතෙන් නිදහස් වූ අසල්වාසී රටක් වන මැලේසියාවේ භූමි පුත්‍ර ප්‍රතිපත්තිය අගය කොට සැලකුවේ මේ නිසා ය. පෑගී සිටි වැඩි ජනතාවක් නඟා සිටුවීම සඳහා වරප්‍රසාද ලත් සුළු ජන කොටස්වල නිදහස ජන අනුපාතය අනුව කාටකාටත් අසාධාරණයක් නොවන පරිදි සීමා කළ යුතු යයි ඔහු ගේ මතය විය. තම රටේ වැඩි දෙනා පිළිගත් නීති ගත රාජ්‍ය ප්‍රතිපත්ති පිට රටවල දී විවේචනය කිරීමට තිබුණු නිදහස සීමා කර තිබීමත්, එ වැනි දේශද්‍රෝහි රාජ්‍ය විරෝධී ප්‍රචාර මහ ගසක් මෙන් වැවෙන්නට පෙර කුඩා පැළය කාලයේ දී ම මර්දනය කිරීමට හොඳින් වග බලාගැනීමත් මැලේසියාවෙන් ගත හැකි ආදර්ශ බව ද ඔහු මතුකර පෙන්වූවේ ය.

**විශ්‍රාම ගෙන සිටි යුගය:**

සාමාන්‍යයෙන් දැන් මෙත්තානන්ද මහතා ගේ තත්වයේ බොහෝ දෙනා ගේ සිරිත නැත්නම් පෙළඹීම වන්නේ රජයේ සේවයෙන් විශ්‍රාම ලබා ගන්නා විට ඊළඟට කරන රක්ෂාව පිළිබඳ ව සෙවීම යි. එහි කිවයුතු වරදක් නැත. එහෙත් මෙත්තානන්ද මහතා වෙනත් විදියකට සිතුවේ ය. ඒ නිසා එ දා මෙත්තානන්ද මහතාට මේ මහ ගැළැපුනේ නැත. ඔහු ගේ ජීවිත අරමුණත්, සසර පුරුද්දත් ජීවිත

අරමුණුත්, සසර පුරුද්දත් ජීවන අත්දැකීම් අනුව ලබාගත් හැකියාවනුත් තමනට හුරුපුරුදු ව තිබුණු වාම් ජීවන ශෛලියත්, තමන් උපන් භූමියේ ආණ්ඩුවෙ තතු පෙනෙන විට පහළවන බලවත් සංවේගයත් නිසා, ඔහු තීරණය කළේ විශ්‍රාම යුගය නැවත රැකියාවක් කිරීම සඳහා යෙද-වීමට නො වේ. දෙ දහස් පන්සියේ බුද්ධ ජයන්ති ධර්ම ඝෝෂාව රටපුරා පමණක් නො ව ලොව පුරා ද පැතිරී යන විට ඒ සමඟ මාර බලවේගයන් ටික ටික තාවකාලිකව වල්වදිමින් ධර්ම බලවේගයන් රජවීමට කරන වෑයමක් පැහැදිලි ව පෙනුණේ ය. ඒ නිසා මෙත්තානන්ද මහතාට ගත හැකි එක ම තීරණය මෙය පමණක් විය. ඒ නිසා ම ඔහු ඒ තීරණය ගත්තේ ය. ලබා ගත හැකි රැකියා කො තරම් වැදගත් වුවත් බලවත් වුවත් ඒවා පසුපස නොගියේ ය.

ආනන්ද විද්‍යාලයේ වැඩ බලන විදුහල්පති වශයෙන් සේවය කරද්දී 1934 දෙසැම්බර් 24 වන දින ගාල්ලේ දී පවත්වන ලද සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ දහසයවැනි සම්මේලන වාරයේ දී මෙත්තා-නන්ද මහතා එහි සභාපති වශයෙන් පත් කර ගන්නා ලදි. පසු කාලයේ ජාතික ආගමික සමාජසේවාවලට පුරෝගාමී වීමට අවශ්‍ය දර්ශනය හා කරුණා සහගත පෙළඹීම සංවර්ධනය වූයේ මේ යුගයේ දී බව පෙනේ. මෙත්තානන්ද මහතා ගේ සමාජ සේවාවට හේතු වූ පොදුජන දයානු-කම්පාව හා කරුණාව මතුවූයේ මේ කාලයේ ඇති වූ මැලේරියා වසංගතය නිසා යයි කීමට තරම් බෞද්ධ සම්මේලනයේ සභාපති වශයෙන් විශේෂයෙන් කෑගලු දිස්ත්‍රික්කයේ එ තුමා විසින් මෙහෙයවන ලද සමාජ සේවාවලින් පෙනේ. ආනන්දයේ වැඩබලන විදුහල්පති වශයෙන් හා සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපති වශයෙන් මෙත්තානන්ද මහතා 1934 – 1935 ඇවුරුදු කාලයේ දී සමසමාජ නායකයනුත්, කතෝලික ක්‍රිස්තියානි ආගම්වල නායකය-නුත්, සිංහල, දෙමළ, ලංසි, ඉංග්‍රීසි හැම ජාතිකයන් ම සමඟ සමඟියෙන් සාමූහික ව දුක් විඳින ජනතාව ගේ දුකට පිහිට වීම සඳහා සෑම සති අන්තයක ම වාගේ කෑගලු දිස්ත්‍රික්කයට ගොස් දානපතියන්ගෙන් ලබාගත් හා රජයෙන් ද ලබාදුන් බෙහෙත් වර්ග ආහාර වර්ග ආදිය දුප්පතුන්ට බෙදා දුන් හැටි වාර්තා කර ඇත්තේ ය. එවකට රජයේ සිවිල් සේවයේ සිටි බ්‍රිතාන්‍ය ජාතික එෆ්. සී. ජිම්සන් මහතා කෑගලු දිස්ත්‍රික්කයේ උප දිසාපතිවරයා ය. ඒ මහතා තම ප්‍රදේශයේ ජනතාව පත්ව ඇති භයානක විපත ගැන අසා ගමක් ගමක් පාසා ගොස් තමා දුටු දේ අනුව වහා ම ක්‍රියාත්මක කළ සහනාධාර බෙදා දීමට මෙත්තා-නන්ද මහතා ගෙනුත් තවත් ජන නායකයන් ගෙනුත් ලැබුණු ආධාරය හා සහයෝගය සටහන් කර තිබුණු හැටි 1967 නොවැම්බර් 8 වැනි දා

යම්ස් පත්‍රයේ වික් එන්ඩ් ස්ක්‍රැප් බුක් නම් තීරයේ මෙසේ පළ විය. ලිපියේ මාතෘකාව වී තිබුණේ මෙසේ ය. ''මෙත්තානන්ද කතෝලිකයන් සමසමාජ කාරයන් සමඟ වැඩකරයි'' ආනන්ද විදුහල්පති මෙත්තානන්ද මහතා ගේ සභාපතිත්වයෙන් පැවැති සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය දුප්පතුන්ට සහනාධාර බෙදා දීමේ දී මට සම්පූර්ණ සහයෝගය ලබා දුන්නේ ය. තව ද ඒ මහතා මා විසින් සමීක්ෂණය කොට නිරණය කළ පරිදි අතිශයෙන් ම දුකට පත් තත්වයක සිටි ජනතාව වසන ගම්වලට රජයේ සහනාධාරවලට අතිරේක ව තවත් බාහිර ආධාර ලබාගෙන ඒවා බෙදා දීම සඳහා තුන් මාසයක් පමණ හැම සති අන්තයක ම වාගේ එම ගම්වල සැරිසැරූ බව සඳහන් කළ හැකි ය. ඒ මහතා ගේ ස්වේච්ඡා සේවක පිරිස් කෙතරම් හොඳින් සංවිධානය කරගෙන සිටියේ ද කියතොත් ආධාර අවශ්‍ය හැම ගමකට ම ඒ ම ආධාර ලැබුණු බව මට දැනගන්නට ලැබුණි. ඒ හැරුණු විට කෙ තරම් ඈත දුර පිහිටි ගම්මානවලට වුවත් ආධාර ලබා දීමට ඒ මහතා වග බලාගත්තේ ය. මෙ සේ මෙත්තානන්ද මහතා නොවරදවා ම ගම්වලට පැමිණ මේ සහනාධාර බෙදාදීම කාර්යක්ෂම ලෙස සංවිධානය කොට මෙහෙය වූ නිසා ඒ සංවිධානය ගැන මම සම්පූර්ණ විශ්වාසය තැබුවෙමි. ඒ බව ගැමියන් අතර ද ප්‍රචාරය කරවීමට වග බලාගතිමි. මෙ සේ කිසි ම භේදයකින් තොර ව එ ම සේවාවන් මෙහෙයවීමට ඒ මහතාගෙන් ලැබුණු සහයෝගය නිසා ඒ දා ඒ වකට තිබුණු කතෝලික පල්ලියේත් වෙනත් දේශපාලන සංවිධානවලත් අය සතුටෙන් හා සමඟියෙන්. කවුරුත් එකට වැඩ කළෝ ය.''

මේ කාලය වන විට පීඩිත ජනතාව ගේ දුක පිළිබඳ විස්තර සොයමින් ඒවා ප්‍රචාරය කරන සංවිධාන ද ඒවාට පිළියම් වශයෙන් වෙනත් සමහර රටවල ක්‍රියාත්මක කරන හිංසාකාරී රාජ්‍ය විරෝධී විප්ලව ගැන ද විශේෂයෙන් නාගරික කම්කරු ජනතාව අතර ප්‍රචාරය කරන අය සිටියෝ ය. ඒ අතර රටට ලැබුණු සර්වජන ඡන්ද බලය නිසා එ තෙක් කල් පෑගී සිටි වැඩි ජනතාවට නිදහස ටික ටික ලැබෙන විට, වරප්‍රසාද ලබාගෙන හිටි ඉංග්‍රීසි උගත් සුළු ජන කොටස් ඒ වරප්‍රසාද ආරක්ෂා කර ගනු සඳහා මානව නිදහස, සුළු ජන අයිතිවාසිකම් ආදියේ නාමයෙන් විවිධ දේශපාලන ව්‍යාපාර ද ආරම්භ කළෝ ය. දුප්පත්කම, අසරණකම හා නූගත්කම දඩම්මා කර ගෙන, ඔවුන් තම තමන් ගේ ආගම්වලට හරවා ගැනීමේ ව්‍යාපාර ද තිබුණේ ය. ඒ නිසා අපේ රටේ සංස්කෘතියටත් දර්ශනයටත්, ගුණ වගාවටත් නොගැලපෙන මේ අන්තවාදී මාර්ගවලින් හැකි තාක් දුරට වැළකී කාටත් පිළිගත හැකි, කාටත් ගැළපෙන දැහැමි දේශීය මඟකින් දුක් විඳින වැඩි ජනතාව ගේ ප්‍රශ්නවලට

විසඳුම් සෙවිය යුතු යැයි සිතන කියන අය ද විශේෂයෙන් අපේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා අතර වූ හ. ඉංග්‍රීසි ලතින් ආදි භාෂා උගන්වන ගුරුවරයකු වුවත් නිතර නිතර තමන් සේවය කළ බොදු විදුහලේ සිසු ගුරු දෙ ගුරු තෙ පිරිසට ම ධර්මානුශාසනා ලබාදීම සඳහා මෙ වැනි උගත් ධර්මධර බෞද්ධ භික්ෂූන් වහන්සේලා ගේ සහාය ලබාගත් නිසා, පොදු ජාතික ප්‍රශ්න විසඳන ක්‍රම ගැන බෞද්ධ මතය දැන ගැනීමට මෙත්තානන්ද මහතාට පුළුවන් විය.

විද්‍යොදය පිරිවෙනෝ ආචාර්ය අතිපූජ්‍ය කළුකොඳයාවේ ප්‍රඥාසේකර හිමි, බම්බලපිටියේ වජිරාරාමවාසී අතිපූජ්‍ය නාරද හිමි, ග්‍රාම සංවර්ධන ව්‍යාපාරවල පුරෝගාමී වූ අතිපූජ්‍ය හිනටියන ධර්මාලෝක හිමි, අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රෙය හිමි, අතිපූජ්‍ය පොල්වත්තේ බුද්ධදත්ත හිමි වැනි උගත් ධර්ම කථිකයන් වහන්සේලා වැඩම කරවා ධර්ම දේශනා හා ධර්ම සාකච්ඡා පැවැත් වූ නිසා බොදු දහම් ඇති මධ්‍යම ප්‍රතිපදාව ප්‍රායෝගික වශයෙන් ගිහි සමාජ ජීවිතයේ ප්‍රශ්න විසඳා ගැනීම සඳහා උපයෝගී කර ගැනීමේ මාර්ග ද ඒ මහතා විමසා බැලුවේ ය. ඒවා ටික ටික සොයා ගත්තේ ය. එ හෙයින් නිදහස ලැබීමට පෙරත් නිදහස ලැබීමෙන් පසුවත් මේ රට යා යුතු මඟ ගැන ඒ මහතාට තරමක පැහැදිලි දර්ශනයක් වර්ධනය වෙමින් තිබුණේ ය. දිනක් මහත්මා ගාන්ධි තුමා ගේ හදිසි මරණය ගැන ආනන්ද මහා විද්‍යාලයේ පවත්වන ලද ශෝක ප්‍රකාශ රැස්වීමක දී ඒ මහතාට කතාකර ගන්නට අමාරු තරමට කඳුළු සලමින් හැඬුණු හැටි එ දා එහි සිටි ශිෂ්‍යයකු ගෙන් දැන ගන්නට ලැබුණේ ය. කෑගල්ල ප්‍රදේශයේ දුකට පත් අයට සහනාධාර බෙදා දීමට ගියේ අනුන් ගේ දුක දැක කම්පාවන හෘදයක් ඇති කරුණාවන්ත සත්පුරුෂයකු නිසා ය. දුක් විඳින ජනතාව වෙනුවෙන් භාරත නිදහස සඳහා සටන් කොට ජීවිතය පූජාකළ මහත්මා ගාන්ධි මහත්මා ගේ මරණය අසා කඳුලු හැලුයේ ඒ කරුණා භරිත හෘදය සංවේගයෙන් කම්පා වූ නිසා ම ය.

එ නමුත් ආනන්දයේ වැඩබලන විදුහල්පති වශයෙන් හා ඊට පසු 1936 සිට 1945 දක්වා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති වශයෙන් ද ඉනික්බිති ව 1954 දක්වා ආනන්දයේ විදුහල්පති වශයෙන් ද සේවය කරන්නට සිදු වූ නිසා ඉන් බාහිර බෞද්ධ සම්මේලනය වැනි වෙනත් සංවිධානවල වගකීම් භාර ගැනීමට එතුමා කැමති වූයේ නැත. තම අදහස් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට නම් මැලිවූයේ ද නැත. එහෙත් වගකීම් භාරගත්තේ නැත. එවැනි වගකීම් භාර ගැනීම නිසා තනතුරු දෙකේ ම වගකීම් හා යුතුකම් සාර්ථක ලෙස ඉටුකිරීමට අවස්ථාව නොලැබෙන නිසා විය යුතු ය. එ නමුත් විශ්‍රාම ලබන කාලය වන 1954

වන විට බෞද්ධ සම්මේලනය මඟින් කරන ලද විශාල ම සේවය වන බෞද්ධ තොරතුරු පරීක්ෂක සහා වාර්තාව ක්‍රියාත්මක කරවීමේ වැදගත් තැනක් ගැනීමට එ තුමාට අවස්ථාව ලැබුණේ ය. මේ රටේ ඉතිහාසය වෙනස් කිරීමට එ තුමාට අවස්ථාව ලැබුණේ විශේෂයෙන් ම මේ සේවය මඟිනි.

ඇත්තවශයෙන් ම මෙත්තානන්ද මහතා මෙන් ම එ දා රට ගැන තැක්කුමක් ඇති කවුරුනුත් වාගේ කල්පනා කළේ රට දේශපාලන වශයෙන් නිදහස් වුවත් රටේ පාලන බලය ලබාගත් බොහෝ දෙනා ඒ නිදහසෙන් පොදු ජනතාවට ප්‍රයෝජන ලබා දීමට ප්‍රමාණවත් වෑයමක් නොකළ බවයි. ඒ වෙනුවට ඒ බලය ලබාගත් බොහෝ නායකයන් යටත් යුගයේ ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබාගත් සුළු පිරිසක ගේ පමණක් හිතසුව පතා ඒ නිදහස වැඩි වශයෙන් උපයෝගී කරගත් බව මෙත්තානන්ද මහතා මෙන් ම වෙනත් බොහෝදෙනා ද දැරූ මතය විය. විශේෂයෙන් ම බෞද්ධ, හින්දු, මුස්ලිම් ජන කොටස්වලින් වැඩි පිරිසකට මේ නිදහසෙන් ප්‍රයෝජනයක් නොලැබෙන අතර ඉංග්‍රීසි උගත් ක්‍රිස්තියානි ආගම වැළඳගත් නැත්නම් යුරෝපීය පන්නයට ජීවත් වූ සුළු ජනකොටසකට පමණක් යටත් යුගයේ දී තිබුණු සියලු වරප්‍රසාද ඊටත් වඩා හොඳින් ආරක්ෂා කර ගැනීමට මේ දේශපාලන නිදහස ආයුධයක් කර ගන්නා බව පැහැදිලි ව පෙනෙන්නට විය. නිදහස ලබනවිට මුළු රටේ ම ජනගහනයෙන් සියයට දහයකටවත් ඉංග්‍රීසි උගත්කමක් ලැබී තිබුණේ නැති නමුත් රට පාලනය කළේ ජනතාවගෙන් සියයට අනූවකටත් වැඩි පිරිසකට නොතේරෙන ඉංග්‍රීසි භාෂාවෙනි. තවමත් නගරබද ව අධ්‍යාපන මාධ්‍යය වූයේ ඉංග්‍රීසියයි. ඒ අතර තම ආගම අත නොහැර ආරක්ෂා කරගත් බෞද්ධ, හින්දු, මුස්ලිම් ජනතාවට කැපී පෙනෙන පරිදි වරප්‍රසාද ලත් සුලු ජන කොටස විසින් වෙනස්කම් කරන බව ද කාගේත් මතය විය. මෙත්තානන්ද මහතාට මෙය විශේෂයෙන් ම විනිවිද පෙනුණු සත්‍යයකි.

අසාධාරණ ලෙස අධ්‍යාපන අවස්ථා බෙදී ගොස් තිබුණු නිසා යටත් යුගයේ ලැබුණු ඉංග්‍රීසි අධ්‍යාපනයේ බලයෙන් හින්දු බෞද්ධ, මුස්ලිම් යන වැඩි ජන කොටස්වලට විශේෂයෙනුත්, මුදුකරයේ ජීවත් වූ දුප්පත් ක්‍රිස්තියානි ධීවර ජනතාවට සාමාන්‍යයෙනුත් සිදුවූයේ නිවහල් නිදහස් යයි කියනු ලබන තමන් ගේ ම රටේ සදාකාලික දුප්පත් වහලුන් ලෙස ජීවත්වීමට ය. මේ අතර මැවුම්කාර දෙවියන් වහන්සේ ලවා නැති බැරිකම් සියල්ල නැති කොට සදාකාලික නිදහස ලබාදෙන පොරොන්දුව පිට විවිධ උපක්‍රම යොදා දුක්විඳින හින්දු බෞද්ධ දුප්පත් අසරණ ජනතාව ක්‍රිස්තියානි ආගමට හරවා ගන්නා ව්‍යාපාර, යටත් යුගයටත්

වඩා ගණනින්, ධන බලයෙන් හා පිරිසෙන් වැඩිවිය. රටේ විවිධ ප්‍රදේශවල විසිරී සිටි මුස්ලිම් ජනකොටස් පමණක් අධ්‍යාපනය නොලබා හෝ තම ආගම රැක ගතයුතු යයි බලවත් අධිෂ්ඨානයෙන් යුක්ත ව මෙ වැනි ව්‍යාපාරවලට යට වූයේ කලාතුරකිනි. ඒ නිසා වරප්‍රසාද ලත් සුළු කොටස් අතර වැඩි වශයෙන් සිටියෝ ඉංග්‍රීසි උගත් ක්‍රිස්තියානි ආගමිකයෝ ය. නැත්නම් ඉංග්‍රීසියේ බලයෙන් බටහිර පන්නයට හැඩ ගැසුණු නාගරික පිරිස් ය. මෙත්තානන්ද මහතා ගේ පිළිගැනීම වූයේ නිදහස් ලංකාව නැවතත් පෙර දී මෙන් සමගි සම්පන්න සාමකාමී සමෘද්ධිමත් රටක් කළ හැකි වන්නේ සර්වජන ඡන්දය පාවිච්චි කොට රටේ පොදු ජනතාව ගේ ප්‍රශ්න විසඳීමට අවංක දයානුකම්පාවක් ඇති පිරිසකට පාලන බලය ලබාදීමෙන් බව යි. විදුහල්පති සේවයෙන් නිදහස් වී විශ්‍රාම යුගය ගත කිරීමට එ තුමා තීරණය කළේ මේ අරමුණ ඉටුකර ගැනීම සඳහා ය.

### මෙත්තානන්ද මහතා ගේ චරිත ලක්ෂණ

බෞද්ධ දහම අනුව මිථ්‍යාදෘෂ්ටියෙන් වෙන් ව සම්‍යක් දෘෂ්ටිය ඇති කර ගත හැකි වන එක මඟක් නම් ඊට අදාළ තොරතුරු, දැනුම හා ආකල්ප අනුන්ගෙන් අසා දැනගෙන හෝ සුදුසු පොතපත කියවීමෙන් ලබා ගැනීමයි. ලබාගත් ඒ දැනුම හා තමන් තුළත්, තමන් අවටත් ඇති යථා තත්වය යෝනිසෝ මනසිකාරයෙන් විමසා බැලීම හෙවත් නුවණ මෙහෙයවා සිතා බැලීම සම්‍යක් දෘෂ්ටිය ඇති කර ගැනීමේ දෙවැනි මාර්ගයයි. එසේ සම්‍යක් දෘෂ්ටිය ඇතිකර ගත් තැනැත්තකු තුළ ජනිතවන යහපත් කල්පනා තුනක් ඇත. නෙක්ඛම්ම සංකල්පය (නෛෂ්ක්‍රම්‍ය සංකල්පය) එයින් පළමුවැන්න යි. එහි අදහස ගිහිගෙය අත් හැරීම පමණක් නොවේ. ගිහිගෙයි සිටියත් එහි ආදීනව දැක ධාර්මික ගිහි ජීවිතයක් ගත කරන කෙනකු වශයෙන් අධික තණ්හා උපාදානවලින් තොර වාම්, අල්පේච්ඡ, සැහැල්ලු, සංවර ජීවිතයක් ගත කිරීමට පෙළෙඹෙන සිතුවිලි පරම්පරාව යි. දෙ වැනි නිවැරැදි කල්පනාව නම් අව්‍යාපාද සංකල්පනාව යි. ක්‍රෝධය හා වෛරයට පටහැනි වූ මෙය හොඳහිත හා මෛත්‍රිය වැඩීමට පෙළඹෙන සිත් වැලකි, තුන්වැන්න නම් නපුරු හිංසාකාරී සිත්වලට පටහැනි, කරුණා, දයාව ආදියට පෙළඹෙන අවිහිංසා සංකල්පයයි. මා දැන සිටි මෙත්තානන්ද මහතා තුළ මේ සම්මා දිට්ඨියත්, සම්මා සංකල්පයත් ලෞකික ජීවිතය ගත කළ ගිහියකු වශයෙන් සෑහෙන පමණ නිසැක ව ම තිබුණු බව කිව හැකි ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් එ තුමා ආර්‍ය අෂ්ටාංගික මාර්ගයේ ඊළඟ අංග තුන වන යහපත් වචන, යහපත් ක්‍රියා හා යහපත් ජීවිකාවන් පැහැදිලි ව ම අනුගමනය කළ

කෙනෙකි. තමන් හා තමන් අවට යථා තත්වය වැඩි වැඩියෙන් දැන ගැනීම සඳහා හොඳ අදහසින් සිත එකලා කර ගැනීමට වෑයම් කිරීම එතුමා තුළ නිතර පැවැති පුරුද්දකි. මේ නිසා එ තුමා කවරදාත් අන්තයන් ගෙන් වැළැකී පැති නොගෙන, වැදගත් ව, විවෘත මනසින් යුක්ත ව ප්‍රශ්න දෙස බලා, ඒවායේ යථා තත්වය තේරුම් ගෙන, ඒවාට ඇති හේතු අස්කර, ප්‍රශ්න විසඳීමට වෑයමක් කළේ ය. මේ අනුව නිගමනය කරන විට කිව යුත්තේ මෙත්තානන්ද මහතා ගිහි බෞද්ධ නායකයකු වශයෙන් මැද පිළිවෙතේ ගමන් කිරීමට අවංක වෑයමක් කළ කෙනකු බවය.

ගිහි බෞද්ධ නායකයකු වශයෙන් ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත, අතිශයින් ම වාම ජීවිත ශෛලියකට ඇබ්බැහි ව සිටි, මෙත්තානන්ද මහතාට තමන් ඇසුරු කළ හැම දෙනාට ම අනුගමනය කිරීමට පෙළෙඹෙන තරම් හොඳ අවංක ආදර්ශවත් චරිතයක් හා පැහැදිලි පීවන දර්ශනයක් තිබුණු බව නොදන්නා කෙනෙකු නැති තරම් ය. එ තුමාට විරුද්ධ ව බොරු චෝදනා ප්‍රචාරය කොට තම තමන් ගේ අන්තවාදී දේශපාලන මත් මතාන්තර හා මිථ්‍යාදෘෂ්ටීන් සනාථ කර ගැනීමට වෑයම් කළ අය අතර පවා මෙත්තානන්ද මහතා ගේ මේ වටිනා විශේෂ චරිතාංග ගැන නම් කිසි ම මත භේදයක් තිබුණේ නැත. මේ නිසා ම එ තුමා ආරම්භ කළ සෑම ව්‍යාපාරයක් ම අපේ ජාතික සංස්කෘතික උරුමයේ පතුලට ම කෙළින් ම සම්බන්ධ විය. යටත් යුගයේ ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා එ තුමා ගේ සමකාලීන බොහෝ දෙනා මෙන් පැහැදිලි පොදු ජාතික ජීවිත අරමුණක් නැති ව මංමුලා වී විජාතික විකාර ව්‍යාපාර මෙහෙයවා වැඩ කරන ජනතාව හෝ වැඩ නොකරන ජනතාව කලබල කරන්නට කල්පනා කළේ නැත. එ වැනි හිංසාකාරී ව්‍යාපාරවලට ජනතාව පොළඹවන අය එ තුමා පිළිකුල් කළේ සංවේගයෙනි.

එ තුමා ගේ සත් ව්‍යාපාර තේරුම් ගැනීමට හා එ තුමාට විරුද්ධ වූ අය හඳුනා ගැනීමට උපයෝගී කර ගත හැකි නිතර පාවිච්චි කළ වචන දෙකක් මෙහි දී ඉදිරිපත් කළ හැකි ය. තුප්පහි සංස්කෘතිය හා තෙම්පරාදු බෞද්ධයන් යනු ඒ නම් දෙකයි. තුප්පහි සංස්කෘතිය යනුවෙන් එ තුමා අදහස් කළේ සියරට හැම දෙයක් ම හෙළා දකිමින්, හා උපහාසයට ලක් කරමින්, පිටරට හැම දෙයක් ම අන්ධානුකරණයෙන් මුදුනින් පිළිගන්නා පරාධීන, වහල්, ආකල්ප ඇති අය ගේ චර්‍යා රටාව යි. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා මේ අතින් මෙත්තානන්ද මහතා ගේ අද්විතීය ගුරුතුමා හෙවත් වීරයා විය. මේ රටේ අතීත සංස්කෘතියත්, පොදු ජනතාව ගේ සිතුම් පැතුම් ආදියත් ගැන නොසලකා නිශ්ශබ්ද ව

හැම දුකක් ම විඳ දරාගත් ජනතාව ගේ ඇවෙන ප්‍රශ්න තේරුම් ගැනීමට වැයම් නොකර, පිටරටවලින් ගෙනා වමේ හෝ දකුණේ නොයෙක් මතිමතාන්තර එ හැම පිටින් ම මේ රටේ ක්‍රියාත්මක කරන්නට වැයම් කළ අය ගේ ඒ ව්‍යාපාරත් ඔහු සැලැකුවේ තුප්පහි වැඩ වශයෙනි. ඒ නිසා ඔහු ගේ විරුද්ධවාදීන් අතර වැඩි වශයෙන් එළිමහනේ පෙරමුණ ගත්තෝ මේ තුප්පහි වැඩ කරන අය ම ය.

මේ අතර තමා ගේ ජාතික ව්‍යාපාරවල දී ප්‍රසිද්ධියේත් අප්‍රසිද්ධියේත් විරෝධතා ව නැත්නම් පිළිකුල දැක් වූ තරමක් උගත් නාගරික බෞද්ධයෝ ද සිටියෝ ය. ඔවුහු ද යටත් විජිත මිථ්‍යාදෘෂ්ටි සම්ප්‍රදායයේ ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා එහි මහන්තත්වය උපයෝගී කරගෙන එ වැනි අධ්‍යාපනයක් නොලබා සිටි දුප්පත් ගැමි ජනතාව ගැන කිසිම තැකීමක් නොකර සිටි නාගරික සුළු ජන කොටසකි. ඔවුහු බලවත්, උගත්, පොහොසත් පිරිසක් වූ හ. මොවුන් මෙත්තානන්ද මහතා නම් කළේ තෙම්පරාදු බෞද්ධයන් වශයෙනි. කෑම් බීම් අතර තෙම්පරාදු කළ කෑමට විශේෂ තැනක් ලබන්නාක් මෙන් ම මේ ඉංග්‍රීසි උගත් බෞද්ධයන් ඉහළ පෙළේ ශිෂ්ට බෞද්ධයන් වශයෙන් ඔවුන් විසින් ම සලකන ලදී. මෙත්තානන්ද මහතා විසින් මෙහෙයවන ලද ජාතික ව්‍යාපාර බොහොමයකින් හිතකර ප්‍රතිඵල ලැබුණේ සිංහල බෞද්ධයන්ට පමණක් නො වේ. එහෙත් ඒ මහතා වැඩි වශයෙන් වෙහෙසුණේ සිංහල බෞද්ධයන් වෙනුවෙන් යැයි කියා අසිංහල අබෞද්ධයන් චෝදනා කරතොත් එය තරමක් දුරට සාධාරණ චෝදනාවකි. එ නමුත් පුදුමයට හේතු වන්නේත්, සංවේගයක් පහළ වන්නේත්, එ තුමා ගේ සේවයෙන් පල ලබමින් ඇතැම් සිංහල බෞද්ධයන් ද එ තුමා පිළිකුල් කොට එතුමාට චෝදනා එල්ල කරන විට ය. මෙත්තානන්ද මහතා ගේ වචනයෙන් කියතොත් ඔවුන් සියල්ලන් ම වාගේ තුප්පහි තෙම්පරාදු බෞද්ධයන් විය යුතු ය. එ තුමාට දොස් කීවේ නැතත් අනුකම්පා කළ යුතු තරමට වැරදුණු තැනකි. එ නම් බුද්ධ ජයන්ති යුගයෙන් පසු මේ රටේ ජාතික අධ්‍යාපන ක්‍රමය පරගැති බවෙන් මුදවා ගෙන නිවහල් දේශීය මඟකට හරවා ගැනීම සඳහා මහඟු අවස්ථාව වූ අධ්‍යාපන ඇමති තනතුර ප්‍රතික්ෂේප කිරීම යි.

අම්බලන්ගොඩ වැනි නගරයක පොහොසත් පවුලක ඉපදී පොහොසත් මෙන් ම බලවත් පවුලකින් විවාහ කරගෙන, එ වකට තිබුණු හොඳ ම විදුහල්වල, සරසවිවල හා දේශ දේශාන්තර සංචාරය මඟින් ද ඉගෙන ගෙන, අපේ ඉහළ ම බොදු විදුහල් ගොඩනඟා, බුද්ධ ජයන්ති යුගයේ දී ජාතිය අවදි කළ මෙත්තානන්ද මහතා අන්තිම කාලය ගත කළේ මුදල් අතින් පොහොසතකු ලෙස නො වේ. එ තුමා ආත්ම

පරිත්‍යාගයෙන් දුකට පත් තමන් ගේ ජාතිය වෙනුවෙන් ලබාගත හැකි සම්පත් කැප කොට දාන පාරමිතාව පිරූ හැටි යි. එසේ නොකර වෙනත් බොහෝ දෙනා ගිය මඟ තෝරා ගත්තේ නම් අවසාන යුගය සැහෙන භෞතික සැප සම්පත් ඇති පොහොසතකු වශයෙන් ජීවත් වීමට කිසිම බාධාවක් නො වී ය. තිස් වසරකටත් වැඩි කාලයක් බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් සේවය කර අවසානයේ ලැබුණු සුළු විශ්‍රාම වැටුප එ තුමා ගේ ආදායම් මාර්ගය විය. එ නමුත් විදුහල් ගොඩනැඟිලි ඇතුළු එ තුමා ආරම්භ කළ ජාතික සේවා සියල්ලට ම නම් මුදල්වලින් කිසිම හිඟයක් වූයේ නැත. ඒවා වෙනත් අය කැමැත්තෙන් ලබාදුන් නිසා ය. ඒ නිසා බොදු ඇසින් බලන විට නම් එ තැන අධ්‍යාත්මික වශයෙන් ඉහළ පෙළේ ම ධනවත් පොහොසත් මහතකු ලෙස සැලැකීමට පුළුවන. තමා වැඩි කාලයක් සේවය කළ ආනන්ද විද්‍යාලයේ උපන්දිනය වන නොවැම්බර් පළමුවන දාක (1967) එ තුමා දිවංගත වූයේ මුළු රටේ ම බෞද්ධ අබෞද්ධ කවුරුනුත් සංවේගයට පත් කරවමිනි. ඒ බව එතුමා වෙනුවෙන් පැවැත් වූ අවසාන ගෞරවයන් ද ඒ දිනවල සන්නිවේදන මාධ්‍යවල පළ වූ ලිපි රාශියෙනුත් පෙනේ. කොතරම් මත භේද තිබුණත් මුළු රටේ ම එ තුමාට ගරු කළ යුතු හැම දෙනා විසින් ම වාගේ තම යුතුකම නොපිරිහෙලා ඉටු කරන ලදී.

මෙත්තානන්ද මහතා ජීවත් ව සිටිය දී ම එ තුමා මේ රටේ ජනතාව අවදි කරවීමට කළ සේවය අගය කළේ සුප්‍රසිද්ධ ලේඛකයකු වන එවකට ලංකාදීප පත්‍රයේ කර්තෘව සිටි ඩී. බී. ධනපාල මහතා ය. ඒ මහතා විසින් නූතන නිදහස් ලංකාව ගොඩනැඟීමට මූලික වූ පුද්ගලයන් විසිදෙදෙනකු ගැන ඉංග්‍රීසියෙන් ලියන ලදුව ඇම්. ඩී. ගුණසේන සහ සමාගමෙන් 1962 දී පළකළපොතක දොළොස්වැන්නා මෙත්තානන්ද මහතා ය. අතිශයෝක්තීන් ඇතත් එහි ඉතා හොඳ හැඳින්වීමක් තිබේ. **ඔහු නිදහස් ලංකාවේ මෙත්තානන්ද මහතා විසින් ජනිත කරවූ බලවේගය හැඳින්වූයේ එවකට බෞද්ධයන් වෙනුවෙන් මෙන් ම ජාතිය වෙනුවෙන් ද විශාල සේවයක් කළ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය හා කොළඹ තරුණ බෞද්ධ සංගමය සමඟ සසඳමිනි. බෞද්ධ සම්මේලනය වැනි සංවිධාන හෝ තරුණ බෞද්ධ සංගම් සියයකටවත් ජනිත නො කළ හැකි බලවේගයක් මෙත්තානන්ද මහතා ජනිත කළ බව ඔහු කීවේ බුද්ධ ජයන්ති යුගයේ ඇති වූ ජාතික ප්‍රබෝධය සියැසින් දුටු නිසා විය යුතු ය.**

(මෙහි ඇතුළත් කරුණු බොහොමයක් ම ලබාගත්තේ මෙත්තානන්ද මහතා ගේ අභාවය නිමිත්තෙන් 1967 නොවැම්බර් මුල් සතිය තුළ අප රටේ සිංහල ඉංග්‍රීසි පුවත්පත්වල පළවූ ලිපිවලිනි. ඒවා සපයා

දීමෙන් හා තවත් අදාළ කරුණු හෙළි කිරීමෙන් අපට උපකාර කළ මෙත්තානන්ද මහතා ගේ වැඩිමල් දියණිය වන දොස්තර කමලාදේවි එදිරිවීරත්, එදිරිවීර මහතාත්, දැනට රෝගී ව සිටින ඇම්. ඩබ්ලිව්. කරුණානන්ද මහතාත් කෘතඥතා පූර්වක ව මෙහි දී සඳහන් කරමි. මෙත්තානන්ද මහතා ගේ අවසාන යුගයේ දී අපට ද ඉතා කිට්ටුවෙන් ඇසුරු කරන්නට ලැබුණු නිසා එහි ප්‍රතිඵල ද මෙහි ඇත.)